Alcohol and Drug Information Centre
ADIC
No.40/18, Park Road, Colombo 05, Sri Lanka.
Tel: +94 11 2584416,+94 11 2592515, Fax: +94 112508484
Email: info@adicsrilanka.org
Web site: http//www.adicsrilanka.org

25/02/2020

හිතවත් පාර්ලිමේන්තු අපේක්ෂකතුමනි/තුමියනි,

**2020 මහා මැතිවරණය - දුම්වැටි, මද්‍යසාර ඇතුළු අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය අවම කර රට සීඝ්‍ර සංවර්ධනයක් කරා යොමුකිරීමේ වැඩපිළිවෙල**

මද්‍යසාර හා දුම්වැටි භාවිතය හේතුවෙන් වාර්ෂිකව 35000කට අධික ලාංකිකයන් ප්‍රමාණයක් මිය යයි. තවද ගංජා, හෙරොයින් වැනි මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් විශාල පිරිසක් මානසික රෝගීන් බවට පත්වෙමින් සිටී.

අපේ රටේ මිනිසුන් දිනකට රුපියල් කෝටි 38ක් සිගරට් වෙනුවෙන් වියදම් කරන අතර අරක්කු සහ බියර් සඳහා දිනක වියදම කෝටි 59කි. දුම්වැටි සහ මද්‍යසාර සමාගම්වලින් රජයට ලබා ගතහැකි ව තිබෙන විශාල බදු මුදල් ප්‍රමාණයක් ක්‍රමවත් බදු ක්‍රමවේදයක් නොමැති බැවින් අහිමිවෙමින් පවතී.

මෙම තත්වය යටතේ මහජන නියෝජිතයෙක් ලෙස තේරීපත්වීමට බලාපොරොත්තුවෙන් සිටින ඔබට දුම්වැටි, මද්‍යසාර හා අනෙකුත් මත්ද්‍රව්‍ය අවම කරමින් රට සීඝ්‍ර සංවර්ධනයක් කරා ගෙනයාමට හැකි ඵලදායී ක්‍රමවේදයන් හඳුන්වාදීමත් ඒ සඳහා ගතහැකි පියවරයන් මොනවාද යන්න පෙන්වා දීමත් මෙම වැඩපිළිවෙලේ අරමුණයි. ඒ සඳහා මෙම ගැටළුව පිළිබඳ වඩා හොඳින් තේරුම් ගැනීමට අප ආයතනය විසින් සකස් කළ තොරතුරු කට්ටලයක් මේ සමග අමුණා ඇත.

අප විසින් දියත්කර ඇති වැඩපිළිවෙලින් බලාපොරොත්තු වන්නේ පහත සඳහන් යෝජනා සඳහා ඔබතුමාගේ/තුමියගේ එකඟතාවය ලබාගැනීමයි.

1. තනි සිගරට් ලෙස දුම්වැටි අලෙවිය තහනම් කිරීම.
2. සම්මත අසුරුම්කරණය නීතිගත කිරීම.
3. අධ්‍යාපන ආයතනයක සිට මීටර 100ක් ඇතුළත දුම්වැටි අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම තහනම් කිරීම.
4. දුම්කොළ සමාගම් රජයට ගෙවිය යුතු බදු අයකර ගැනීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරීම.
5. දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරි පනතට යෝජනා කර ඇති සංශෝධන සම්මත කිරීම.
6. වසර 2016 දී පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද මද්‍යසාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
7. ශ්‍රී ලංකාව තුළ ගංජා නීතිගත කිරීමට ඉඩ නොදීම.
8. හෙරොයින් ඇතුළු අනෙකුත් සියලු ම මත්ද්‍රව්‍ය සඳහා දැනට පවතින නීති නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.

සාක්ෂි මත පදනම් වු මද්‍යසාර, දුම්කොළ සහ අනෙකුත් මත්ද්‍රව්‍ය පාලනය සඳහා ගත හැකි පියවරයන් පිළිබඳ විද්‍යාත්මක පැහැදිලි කිරීමක් මෙම තොරතුරු කට්ටලයේ අඩංගු වේ.

මෙම වැඩපිළිවෙල පිළිබඳ ඔබතුමාගේ/තුමියගේ එකඟතාවය දැන ගැනීම සඳහා මේ සමග එවා ඇති යෝජනාවලිය අත්සන් කර අපගේ නියෝජිතයා වෙත ලබා දෙන මෙන් කාරුණික ව ඉල්ලා සිටිමු. ඡන්ද දායකයන්ගේ දැනගැනීම පිණිස ඔබගේ මෙම එකඟතාවය අපි විසින් ප්‍රසිද්ධියට පත්කරවන_බව ද තවදුරටත් දන්වා සිටිමු.

මෙම වැඩපිළිවෙල සම්බන්ධයෙන් වැඩි විස්තර අවශ්‍ය නම් එම සහයෝගය ලබා දීමට අපි කැමැත්තෙන් සිටිමු. ඒ සඳහා අමරනාත් තැන්න 0714240238 හෝ සම්පත් ද සේරම් 0714353248 අමතන්න.

ස්තූතියි.

පුබුදු සුමනසේකර
විධායක අධ්‍යක්ෂ